ස්වාධීන තරුණ බලවේගය
சுதந்திர இளைஞர் சக்தி
INDEPENDENT YOUTH POWER

අපේ රට අපේ දෑකින් හොඳිනහමු





ස්වාධීන තරුණ බලවේගය

சுதந்திர இளைஞர் சக்தி

INDEPENDENT YOUTH POWER

ප්‍රතිපත්ති ප්‍රකාශය

නායකතුමාගේ පණිවිඩය



“

රටේ සියලුම ප්‍රගතිශීලී තරුණ උගත් සමාජය බලගැන්වීම තුළින් ශ්‍රී ලාංකීය සමාජය පරිවර්තනය කල හැක.

ස්වාධීන තරුණ බලවේගය යනු හුදෙක් තවත් දේශපාලන පක්ෂයක් නොව රටෙහි සියලු ක්ෂේත්‍රයන්ගේ ප්‍රගමනය ප්‍රමුඛ අපේක්ෂාව කරගත්, නොබෙදුනු රටක් තුල සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙළගැසුණු උගත් තාරුණ්‍යයේ නැගීසිටීමකි.

දේශපාලන, සමාජීය සහ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම් වූ සමාජයක් ගොඩනැගීම අපගේ මූලික අරමුණයි. එහිදී සාමාන්‍ය මිනිසුන් සවිබල ගැන්වීම හරහා සමාජයේ පවතින බලයේ සහ ධනයේ අසමානතා අභියෝගයට ලක් කිරීමට අප උත්සාහ කරන්නෙමු. සෑම කෙනෙකුටම යහපැවැත්ම පිළිබඳ සහතික ප්‍රමිතියක් ඇති සමාජ හා ආර්ථික සාධාරණත්වයක් ඇති වීම මෙහිලා අපේක්ෂා කෙරේ. එසේම දූෂිත දේශපාලනයට තිත තැබීම ප්‍රධාන අරමුණු ක්‍රියාත්මක කිරීමේදී ඉතා වැදගත් සාධකයක් ලෙස අපි තරයේ විශ්වාස කරන්නෙමු. එපමණක් නොව සෑම ආයතනයකම අල්ලස, දූෂණය හා නාස්තිය නවතාලිය හැකි සියලු ක්‍රමවේද පෙරමුණට ගෙන ඒම වැදගත් වේ.

රටේ සියලුම ප්‍රගතිශීලී තරුණ උගත් සමාජය බලගැන්වීම තුළින් ශ්‍රී ලාංකීය සමාජය පරිවර්තනය කල හැක. අපගේ මූල ධර්ම වන්නේ මානව ගරුත්වය, මානව හිමිකම්, සමානාත්මතාවයේ වටිනාකම්, මහජන සහභාගීත්වය සහ "ශ්‍රී ලාංකික" යන සංකල්පයන්ය. මූලික වශයෙන් ආර්ථිකය සහ සමාජය වෙන් කළ නොහැකි බව අපි විශ්වාස කරන අතර ශක්තිමත් ආර්ථිකයක් යහපත් සමාජයක් සඳහා අවශ්‍ය වේ. අපගේ දැක්මට අවශ්‍ය වන්නේ කාර්යක්ෂම සහ සමෘද්ධිමත් ආර්ථිකයකින් පමණක් නිපදවිය හැකි රටක් බිහිවීමයි. සියලුම පුරවැසියන්ට වැඩ කිරීමේ අයිතිය ලබා දීම සහ ඒ වෙනුවෙන් ලබා දෙන දායකත්වය සඳහා හොඳින් උපයා ගැනීමේ අයිතිය තිබිය යුතු බවද අපි නිසැකවම දනිමු.

අපගේ මේ නව්‍ය දේශපාලන සංකල්පයට ඔබගේ සහයෝගය ලැබීම වනාහි ඔබේත් ඔබේ රටේත් සාරගර්භ වෙනසකට මාවත එළි පෙහෙළි කිරීමකි.

සුසන්ත වීරසිංහ
නායක
ස්වාධීන තරුණ බලවේගය





සමෘද්ධිමත් ආර්ථිකයක්

අපේ රටේ දැනට පවතින්නේ කඩා වැටී ඇති ආර්ථිකයකි. මෙය නගා සිටුවීම අප හමුවේ ඇති ප්‍රබල අභියෝගයකි. එයට විධිමත් ක්‍රමවත් වැඩ පිළිවෙලක් හඳුන්වා දීමට ස්වාධීන තරුණ බලවේගයට හැකියාව ඇත. අපගේ ආර්ථික ප්‍රතිපත්තිය ඔස්සේ දිග හරිනු ලබන්නේ ඉතාමත් සූක්ෂම ක්‍රම මඟින් රටේ ආර්ථිකය නංවාලීමයි.

අපේ රට මුළු වර්ෂය පුරාම ඉතාමත් හොඳ කාලගුණ තත්ත්වයක් පවතින රටකි. මෙහිදී රට අභ්‍යන්තරය තුල පවතින කෘෂිකර්මාන්තය දියුණු කිරීම සහ මිරිදිය මත්ස්‍ය වගාව දියුණු කිරීම තුලින් අභ්‍යන්තර ආහාර නිෂ්පාදනය රට තුළම ඇතිකර ගත හැක. අපේ ආදී මුතුන්මිත්තන් විසින් නිර්මාණ කරන ලද වැව් නැවත ප්‍රතිසංස්කරණය කිරීමට මුල්තැන දීම හරහා කෘෂි කර්මාන්තයට අවශ්‍ය කරනු ලබන ජලය හිඟයකින් තොරව ගොවියන්ට ලබාදීමට හැකියාව ලැබේ.

ඊට අමතරව වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තයද දියුණු කර ගැනීමට හැකිවේ. දේශීය කෘෂිකර්මාන්තය වර්තමාන තත්ත්වය යටතේ ඉතාමත් කණගාටුදායක මුහුණුවරක් ගෙන ඇත. ගොවියන්ට වගා කිරීමට යන වියදම සහ අස්වනු නෙලීමෙන් ලැබෙන ලාභය අතර වැඩි වෙනසක් නොමැත. එම නිසා ඔවුන් වගාකිරීම නවතා වෙනත් රැකියාවන්හි නිරත වේ. මෙය අපේ රටට විශාල පාඩුවකි. මෙම තත්ත්වය නිසා තව තවත් පිට රටින් ආහාර පාන වර්ග ආනයනය කිරීමට සිදුවී ඇත.

මෙම තත්ත්වය නිසිලෙස හඳුනාගෙන ඊට පිළියම් ලෙස කෘෂිකර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරමින් පවතී. එය මෙලෙස විස්තර කළ හැක. වී වගාවට යොදනු ලබන කෘෂි රසායනික ද්‍රව්‍ය වල දැනට පවතින බදු 100% ක් ඉවත් කරනු ලැබේ. මෙමගින් වගාවන් සඳහා යනු ලබන නිශ්පාදන පිරිවැය විශාල ප්‍රමාණයකින් අඩුකර ගත හැකිවනු ඇත. එමගින් මහජනතාව අතර කෘෂිකර්මාන්තය සඳහා ඇති රුචිකත්වය තවත් වැඩි කරගැනීම අරමුණු කෙරෙයි. අපේ ප්‍රධාන අරමුණ සියළුම පුරවැසියන් කුසගින්නෙන් මුදවා ගැනීම සහ ඔවුන්ට ඉතාමත් රසවත් ගුණවත් ආහාර වේලක් ලබා දීමයි.

රටේ කෘෂිකර්මාන්තය ක්‍රමක්‍රමයෙන් සාම්ප්‍රදායික කෘෂි කර්මාන්තය වෙත යොමු කරනු ලැබේ. මෙමගින් ආහාර බෝග සඳහා යොදනු ලබන රසායනික ද්‍රව්‍ය ක්‍රමයෙන් අඩුකර ගැනීම අරමුණ වේ. අපේ රට තුල දැනට පවතින්නේ ඉතා දීර්ඝ කාලයක් තිස්සේ කෘෂි රසායනික ද්‍රව්‍ය යොදා වගා කල භූමියකි. මෙම නිසා එක්වරම අපිට සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයට සහ කාබනික පොහොර භාවිතයට යෑම කල නොහැකි කටයුත්තකි.

ස්වාධීන තරුණ බලවේගය මෙය හොඳින් අවබෝධ කරගෙන ඇත. එබැවින් අප ආරම්භයේදී රසායනික පොහොර යොදා වගාකරන ලද බිම් හඳුනාගෙන එම ප්‍රදේශ තව දුරටත් රසායනික පොහොර යොදා වගා කරනු ලැබේ. අනෙක් කරුණ නම් වගා නොකරන ලද ගොවිබිම් හඳුනාගෙන එම බිම් නැවත වගාකිරීම ආරම්භ කරන අතර එම ගොවිබිම් සාම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම සහ කාබනික පොහොර යොදා වගා කිරීම කරනු ලැබේ. මෙමගින් දේශීය වෙළඳපොලට රසායනික පොහොර යොදා වගාකරන ලද ද්‍රව්‍යයන් සහ කාබනික පොහොර යොදා වගාකරන ද්‍රව්‍යයන් එකතු වේ.

විෂ රසායන නොමැති ආහාර සඳහා ක්‍රමක්‍රමයෙන් අපේ වෙළඳපොල හුරුකිරීම තුලින් මහජනතාවට එම ආහාර ද්‍රව්‍ය ඉතා අඩුමිලට ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. රට අභ්‍යන්තරය තුල අපට අවශ්‍ය ආහාර නිෂ්පාදනය කර ගැනීම තුලින් ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය ක්‍රමයෙන් නවතාලීම සිදුකළ හැක. ගොවීන් විසින් වගාකරනු ලබන අස්වනු මිලදී ගැනීමට රාජ්‍ය යාන්ත්‍රනයක් ක්‍රියාත්මක කරනු ලැබේ. දැනට වසාදමා ඇති රජයේ වී ගබඩා සියල්ල නැවත ප්‍රතිසංස්කරණය කොට එම අස්වනු ගබඩා කිරීම සුදුසු පරිදි සකස් කරනු ලැබේ. මේ රටේ වගාකල හැකි සියළුම බිම් හඳුනාගෙන ඒවා වගාකිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ගොවීන්ට ලබා දෙනු ලැබේ. රටතුල ආහාර අවශ්‍යතාව පරිපූර්ණ වූ පසුව අතිරික්ත බෝග අස්වැන්න අපනයනය කිරීමට කටයුතු කෙරේ. මෙමගින් රටේ ආර්ථිකය ඉහල නැංවීම සිදු කල හැක.

වර්තමානයේ අපේ රටේ ආර්ථිකය රඳා පවතින්නේ ආනයන සහ සේවා මතයි. මෙම තත්වය රටක සංවර්ධනය පහත හෙලන ක්‍රමවේදයකි. අනුන්ගෙන් යැපෙන ආර්ථිකයක් වෙනුවට ස්වෝත්සාහයෙන් නැඟී සිටින ආර්ථිකයකට රට පරිවර්තනය කිරීම අපගේ අභිලාෂයයි. කලින් කලට ඇතිවන දරුණු ව්‍යසනයන් වෙනුවෙන් මුහුණ දීමට අපි නිරතුරුවම සූදානම් විය යුතුයි. ඒ වෙනුවෙන් අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරගැනීම අප සතු වගකීමකි.

ඉතා කෙටි කාලයක් තුළ වගා සංග්‍රාම දියත් කර වී, මුං ඇට, කව්පි, කුරක්කන් වැනි ධාන්‍ය වර්ග වගා කරනු ලැබෙයි. රටෙහි අතිරික්ත අස්වැන්න ගබඩා කිරීම සිදු කරනු ලැබේ. රජයේ ධාන්‍යාගාර ගබඩා ශක්තිමත් කිරීම ප්‍රධාන අරමුණයි. අපගේ දේශීය වෙළඳපොල තුල වෙළෙඳුන් විසින් සිදුකරනු ලබන කෘතිම වෙළෙඳපොල හිඟයට මුහුණදීමට රජය ශක්තිමත් විය යුතුයි. එවැනි දේට මුහුණ දීමට අප සතුව ආර්ථික සංවිධානයක් තිබිය යුතුයි. එවිට මහජනතාවට සිදුවන අපහසුතාවයන් වලක්වාගත හැක. අතීතයේදී රටතුල හේන් ගොවිතැන ඉතා ප්‍රසිද්ධ කර්මාන්තයක්ව පැවතුනේය. විශේෂයෙන් වියළි කලාපය තුල මෙය ඉතාමත් ප්‍රසිද්ධ නමුත් දැන් මේ පිළිබඳව මහජනතාවගේ එතරම් කැමැත්තක් නොමැත. මේ නිසා තල, කුරක්කන්, මිනේරි, බඩඉරිගු, මුං ඇට, කව්පි, ආදී බෝගවල හඟයක් හා මිල ඉහළ යාමක් දක්නට ලැබේ. ආර්ථික වශයෙන් හා ගුණාත්මක තත්ත්වයෙන් ඉතාමත් වටිනා බෝගයන් ලෙස මේවා හැඳින්විය හැකිය. වර්තමානයේදී මේවා වෙනුවට සම්පූර්ණයෙන් ආනයනය කරනු ලබන පරිප්පු වැනි දේට හුරුවී ඇත. මෙවැනි බෝග ක්‍රමයෙන් ආනයනය නතර කල යුතුය. ඒ සඳහා දේශීයව වගාකල හැකි කව්පි, මුංඇට වැනි බෝග සඳහා යොමු විය යුතුය. ඒවා වගාකිරීමට ඇති අපහසුතා හදුනාගෙන ඒවාට නිසි පිළියම් යෙදිය යුතුය. මේවායේ නිෂ්පාදන වියදම පහත හෙලීම තුළින් අපිට මෙම කර්මාන්ත වෙත ජනතාව වැඩි වශයෙන් පෙළඹවිය හැක.

වීවා දේශීය වෙළෙඳපොල වෙත ඉතා අඩු මුදලකට ලබාදිය හැක. මුං ඇට වැනිදේ යොදාගෙන වෙනත් ආහාර වර්ගද නිපදවිය හැක. බඩඉරිගු සඳහා විදෙස් වෙළඳපොල තුලද විශාල ඉල්ලුමක් පවතී. මෙම බෝග වර්ග වැඩිපුර නිෂ්පාදනය කොට විදේශ වෙළෙඳපොල තුල අපගේ පංගුව අත්පත් කර ගත යුතුයි. එමගින්ද විදේශ විනිමය රට තුළට ගලාගෙන එනු ලැබේ. එසේම රටේ මහජනතාව ද දේශීයව නිෂ්පාදන කරනු ලබන පෝෂ්‍යදායී ආහාර රටාවකට හුරු කිරීමට පුලුවන.

අප රටේ ප්‍රධාන අපනයන බෝග ලෙස නම් කරන ලද තේ, පොල්, රබර් සහ කුළු බඩු වර්ග වගා කිරීම සිදුවන්නේ ඉතාම අඩුවෙනි. මෙයට හේතුව ලෙස අප දකින්නේ දිනෙන් දින ඉහල යන නිෂ්පාදන පිරිවැයයි. මේ නිසා වැවිලි කරුවන් එම බෝග වගා කිරීම නවතා දමා වෙනත් කර්මාන්ත හා රැකියාවල නිරත වී ඇත. මෙය රටේ ආර්ථිකයට විශාල හානියකි. බෝග සඳහා යොදනු ලබන කෘෂි රසායනික ද්‍රව්‍යවල මිල සහ කම්කරු වැටුප් ඉහල යාම නිසා මෙම තත්වය ඇතිවීමට බොහෝ සෙයින් හේතු වී ඇත. අප නිතරම සිතිය යුත්තේ අපේ රටට විදේශ විනිමය ගලාගෙන එනු ලබන ක්‍රමවේද පිළිබඳවයි. ඒ සඳහා රටතුල වැඩිපුර නිෂ්පාදන කල යුතුයි. අපේ රටේ කුලු බඩු සඳහා හොඳ ඉල්ලුමක් යුරෝපය තුල පවතී. මෙය නැවත සක්‍රීය කරගත යුතුයි. එමගින් අපට තවත් වාසි සැලසෙනු ඇත.

අප රට තුළ පළතුරු වර්ග විශාල ප්‍රමාණයක් පවතී. සමකාසන්න රටවල වැවෙන පළතුරු සඳහා ලෝක වෙළෙඳපොල තුල විශාල ඉල්ලුමක් පවතී. අප රටේ වගාකල නොහැකි බෝගයක් නැති තරම්ය. ස්වාධීන තරුණ බලවේගය මෙය මැනවින් අවබෝධ කොට ගෙන ඇත. පළතුරු වගා කිරීම සඳහා ද ක්‍රියාමාර්ග ගෙන ඇත. දොඩම්, අඹ, කෙසෙල්, මැංගුස්, රඹුටන්, පේර, ඩ්‍රැගන් ෆෘට්, ආදී පළතුරු සඳහා දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොල තුළ ඉල්ලුම දිනෙන් දින ඉහළ යමින් පවතී. මේවා දිවයිනේ විවිධ ප්‍රදේශ තුළ වගාකල හැකි බෝගයන්ය.

දෙහි, දොඩම්, ආදී ශාක තුළින් විශාල අස්වැන්නක් එකවර ලබාගත හැක. තවද සියඹලා වැනි බෝගවලටද මූලිකත්වයක් දිය යුතුය. ආනයනය කරනු ලබන ඇපල්, මිදි, වැනි පළතුරුවලට මහජනතාව හුරු වීම නිසා දේශීය පළතුරුවලට ඇති ඉල්ලුම පහත වැටී ඇත. මෙවැනි සිදුවීම් රටතුළ ආර්ථිකය කඩා වැටීමට හේතු වී ඇත. ඒ නිසා දේශීය වගාවන් නැවත ඇති කිරීම තුලින් විශාල ආදායමක් උපදවා ගත හැක.

ධීවර කර්මාන්තය වනාහි රටේ ආර්ථිකයට ප්‍රධාන වශයෙන්ම වැදගත් වන කොටසකි. ලංකාව සාගරයෙන් වටවූ දූපතකි. ඊට අයත් මුහුදු කලාපය තුල මත්ස්‍ය සම්පත් ඉතා බහුලව පවතී. දෛනිකව විශාල මත්ස්‍ය තොගයක් අලුතින් අපේ වෙළඳපොලට එකතුවේ. මත්ස්‍ය නිෂ්පාදනය නිසියාකාරව කළමණාකරනය කොට රට අභ්‍යන්තරයට අවශ්‍ය මත්ස්‍ය ප්‍රමාණයට අමතරව ඉතිරිවන නිෂ්පාදනය ගබඩා කිරීමට මෙහිදී මුල්තැන දෙනු ලැබේ. ඒ අනුව මුහුදුබඩ කලාපයේ සිට රට අභ්‍යන්තරයට මෙම මත්ස්‍ය අස්වැන්න රැගෙන ඒම තවමත් අසීරු කාර්යයකි. ඒ නිසා දිවයිනේ ස්ථාන රැසක ශීතාගාර ඉදිකර එම ස්ථානයන්හි මත්ස්‍යයින් ගබඩා කරනු ලැබේ. ඉන් මෙම ආහාර නරක් නොවී කල් තබා ගැනීමට පුළුවනි. අනතුරුව දිවයිනේ සෙසු ප්‍රදේශවලට මෙම මත්ස්‍යයින් ප්‍රවාහනය කිරීම පහසුවේ. ඉතා අඩු මිලට මිලදී ගැනීමට ද හැකියාව ලැබෙනු ඇත. මෙයින් වෙළෙඳපොල තුල මාළු හිඟවීම වැලකී යනු ඇත.

අපට අවශ්‍යවන්නේ මත්ස්‍ය ආනයනය ක්‍රමයෙන් නවතාලීමටයි. එය අපේ රටේ ආර්ථිකය මැනවින් පවත්වා ගැනීමට රුකුලක් වේ. මෙහිදී දේශීය ධීවරයා දිරිගැන්වීම සඳහා අප විසින් විශේෂ සහන රැසක් ලබාදීමට බලාපොරොත්තු වේ. ලංකාව ආශ්‍රිත මුහුදු කලාපය තුල විදේශ රටවල ධීවරයින්ට මසුන් ඇල්ලීම තහනම් කරනු ලැබේ. අපි විසින් ධීවර ජනතාවට රජයේ රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබේ. තවද ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමයක් සහ ඒ සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ.

මෙහි අරමුණ ධීවර කේෂ්ත්‍රය නගා සිටුවීම සඳහා වැඩි පිරිසක් යොමු කරවීමයි. අප හැමවිටම දේශීය පරිභෝජනය සඳහා දේශීය සම්පත් භාවිතා කළ යුතුයි. එය අපේ රට සංවර්ධනය සඳහා කදිම ක්‍රමයකි.

විසිතුරු මසුන් කර්මාන්තය අප රටේ චිතරම් ප්‍රචලිත නොවුනද විශාල විදේශ විනිමයක් උපයාගත හැකි කර්මාන්තයකි. මෙය වැඩි දියුණු කිරීම තවත් අපගේ එක් බලාපොරොත්තුවකි. මේ සඳහා විදේශ වෙළෙඳපොලට විසිතුරු මසුන් අලෙවි කිරීමට ක්‍රමවේදයක් සකස් කරනු ලැබේ. විසිතුරු මසුන් ඇති ස්ථාන වැඩි කිරීමට පියවර ගනු ලැබේ. ඒ සඳහා ජනතාව උනන්දු කිරීමට වැඩ පිළිවෙලක් දියත් කරනු ලැබේ.

විදෙස් ශ්‍රමිකයන් විසින් රටේ ආර්ථිකයට දක්වන්නේ හොඳ දායකත්වයකි. කාන්තාවන් විදෙස් රටවල බැලමෙහෙවර සඳහා යැවීම තරුණ සංවිධානයක් ලෙස අප කිසිසේත්ම අනුමත කරන්නේ නැත. කාන්තාවන් බැලමෙහෙවර සේවයට යවනවා වෙනුවට වෘත්තීය පුහුණුවක් ලබාදී විදෙස් රටවල යම් යම් වෘත්තීන් වෙත යොමු කිරීම අපගේ අරමුණයි. එහිදී මවුවරුන් විදෙස් සේවයට යොමු කිරීමට කටයුතු කරනනේ නැත. මව්වරුන් තමන්ගේ දරුවන්ට සෙනෙහස ලබාදීම සහ ඔවුන් රැක ගැනීමට කටයුතු කල යුතුයි. අප සමාජය මාතෘ මූලික සමාජයකි. අම්මා යනු දරුවන්ට අවශ්‍ය කෙනෙකි. ඇයගේ සෙනෙහස දරුවන්ට සහ ස්වාමි පුරුෂයාට ලබාදීම ඇයගේ වගකීමයි. එය රැකදීමට කටයුතු කිරීම අපගේ වගකීමයි. විදෙස් ශ්‍රමිකයන් අතර නාවුක වෙළෙඳ කේෂත්‍රයේ සේවකයින් රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් සපයයි. මෙම වෙළඳ නාවුක කේෂ්ත්‍රයට අවශ්‍ය සේවකයින් ප්‍රමාණය තවමත් නිසියාකාරව සපයා දීමට කිසිදු රටකට නොහැකිය. අප විසින් මෙම කේෂ්ත්‍රයට වැඩිපුර සේවකයින් ලබාදීමට කටයුතු කරනු ලැබේ. එමගින් රටේ ආර්ථිකය ශක්තිමත් වනු ඇත. වෙළඳ නාවිකයින් දිරිගැන්වීමේ වැඩසටහන් අපගේ රජයක් යටතේ ක්‍රියාත්මක කිරීමට අපි කටයුතු සැලසුම් කර තිබේ. වෙළඳ නාවුක කේෂ්ත්‍රයට පිවිසෙන සියලුම පුද්ගලයින් සඳහා ඉක්මනින්ම රැකියා මංපෙත් විවරකරදීමට අපි කටයුතු කරනු ලැබේ.

මෙහිදී ලෝකයේ නාවුක වෙළඳ කටයුතු කරනු ලබන සමාගම් අපි හොඳින් දන්නා අතර ඔවුන් සමඟ සාකච්ඡා කොට අපගේ සේවකයින් එම සමාගම් වෙත යොමු කරනු ලැබේ.

විදෙස් ගතවන ශ්‍රමිකයින්ගෙන් කිසිදු අයතා මුදලක් ගැනීම තහනම් වේ. විදේශ රටවලට අවශ්‍ය කරනු ලබන සේවකයින් යොමු කිරීම රජයේ ආයතන මගින් ද සිදුකරනු ලැබේ. එහිදී ඉතාම අඩු මුදලකින් පුද්ගලයින් සඳහා විදෙස්ගත වීමට හැකියාව ලැබේ. අප දන්නා පරිදි දැනට ලංකාවෙන් විදෙස් ගතවීම සඳහා විශාල මුදලක් දැරීමට සිදුවේ. මේ සියලුම වැරදි මාර්ග අප විසින් වසාදමනු ලැබේ. මෙවැනි අයතා මුදල් ලබා ගැනීම නිසා අප රටේ බොහෝමයක් තරුණ තරුණියන් මහමග නිකරුනේ කාලය ගෙවා දමනු ලැබේ. එය රටට මහත් බරකි. වැඩ කිරීමට වයස හා ශක්තිය ඇති තරුණ තරුණියන්ගෙන් රටට ලැබිය යුතු දායකත්වය අප ඔවුන්ගෙන් නිසියාකාරව ලබාගත යුතුයි. එමනිසා ඒ සඳහා ඇති බාධක ඉවත් කොට ඔවුන් වැඩි ප්‍රමාණයක් විදෙස් ශ්‍රමිකයන් ලෙස යොදාගෙන මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරගත යුතුයි. ඒ සඳහා අපි ක්‍රියාමාර්ග රාශියක් ගනු ලැබේ. විදෙස් ගතවීමේ දී යම් යම් ආයතන මගින් ගනු ලබන විශාල මුදල් නිසා මෙම තරුණ තරුණියන් අසරණ වී ඇත. අපි විසින් එම ක්‍රමය තහනම් කරනු ලැබේ. විදෙස් ගතවීමේදී දැරිය යුත්තේ අවම මුලික ගාස්තු පමණි. එම අවම ගාස්තුව විදෙස් ශ්‍රමිකයින් ඉල්ලා සිටිනු ලබන රටවල සමාගම් මගින් දරනු ලැබේ. මෙවැනි ක්‍රමයක් යටතේ විශාල තරුණ තරුණියන් කොටසකට විදෙස් රැකියා සඳහා යාමට හැකියාව ලැබේ. එය අපේ රටේ ආර්ථිකයට ඉතා හොඳ තත්ත්වයකි.

අපේ රටේ සමෘද්ධිලාභී පවුල් විශාල ප්‍රමාණයක් සිටී. ඔවුන්ද රටේ ආර්ථිකයට දායක කරගත යුතුයි. මේ වනවිට ජනතාවගෙන් එකතු කරන ලද විශාල බදු මුදල් ප්‍රමාණයක් සමෘද්ධිලාභී පවුල් සඳහා රජය විසින් ගෙවනු ලැබේ. එම පවුල්වලින් නැවතත් රටේ ආර්ථිකයට විය යුතු සේවය ලබා ගත යුත්තේ කොයි ආකාරයටද යන වග කිසිදු රජයක් විසින් සිතා බලා නොමැත.

මේ නිසා අප සමෘද්ධිලාභී පවුල් රටේ ආර්ථිකයට දායක කර ගත හැකි ආකාරය පහත විග්‍රහ කරනු ලැබේ. රටේ ප්‍රධාන අවශ්‍යතාවයක් වන පොල් සම්බන්ධ ගැටලුවට මෙම සමෘද්ධිලාභී පවුල් සෘජුව සම්බන්ධ කරගත හැක. අපි විසින් එම පවුල් සඳහා පොල් පැල 2 ක් හෝ 3 බැගින් ඉඩමේ ප්‍රමාණය අනුව ලබාදෙනු ලැබේ. එම පොල් පැල සමෘද්ධිලාභී පවුල් විසින් රැකබලාගෙන වගා කල යුතුයි. මේ පොල් පැල වසර 3 කින් හෝ 3 1/2 කින් පොල් ඵලදාව ලබාදෙනු ලබන වර්ගයේ ඒවා වේ. අප රටේ සිටින මුළු සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව ලක්ෂයකට අධික වේ. වසර 3 1/2 කදී මෙම පොල් ඵලදාව රටේ ආර්ථිකයට දායකවේ. මෙම පොල් ඵලදාවට රජයේ යාන්ත්‍රනයක් හරහා රජයේ ගබඩාවෙත ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. ඉන්පසුව එම පොල් දේශීය වෙළඳපොලට නිකුත් කරනු ලැබේ.

අප හොඳින් දන්නා කරුණක් නම්, අප රට තුළ විශාල සම්පත් ප්‍රමාණයක් ඇති බවයි. අවාසනාවකට අපේ කිසිදු රජයක් මෙවැනි වටිනා සම්පත් නිසි ප්‍රයෝජනයක් නොගෙන අතහැර දමා ඇත. අපේ භූමිය තුල බණිජ සම්පත් බහුලව පවතී. මේවායින් කර්මාන්ත ආරම්භ කර රටේ ආර්ථිකයට දායක කරගත යුතුයි. ස්වාධීන තරුණ බලවේගයේ අපි නැවතත් රටතුළ කර්මාන්ත පද්ධතියක් දේශීය සම්පත් යොදාගෙන ආරම්භ කරනු ලැබේ. එප්පාවල ඇපටයිට්, පුල්මුඩේ සිලිකා වැලි, ආදී නොයෙකුත් දෑ වගේම, ගුවන්යාන නිෂ්පාදනයේදී එහි අමුද්‍රව්‍යයක් වශයෙන් යොදා ගනු ලබන ටයිටේනියම් ලෝහයත්, පැන්සල්වල තුඩ නිර්මාණය කරනු ලබන මිනිරන් ලෝහයත් ප්‍රයෝජනයක් නොගෙනම තිබීම මහත් කණගාටුවට කරුණකි.

මේ වාගේම අපිට මැණික් කර්මාන්තය තුළින්ද විශාල මුදලක් සොයා ගත හැකිය. නමුත් කණගාටුවට කරුණක් නම් එම මුදල් කණ්ඩායම් කිහිපයක් අතර බෙදී යාමයි. මෙය සම්පූර්ණයෙන්ම වෙනස් විය යුතුයි. මේ නිසා අපි මෙවැනි කර්මාන්ත සඳහා තව තවත් මිනිසුන් යොදවා කර්මාන්ත දිරි ගැන්වීම් කරනු ලැබේ. මෙමගින් රටේ ආර්ථිකය ඉහල නංවා ගැනීමට හැකියාව ලැබේ.

අප රටේ මෑත කාලයේදී ඉදිකරන ලද මත්තල ගුවන්තොටුපල සහ හම්බන්තොට වරාය රටේ ආර්ථික වර්ධනයට දායක කරගත යුතුයි. මේ සඳහා ලෝකයේ විවිධ රටවලට අයත් ගුවන් සමාගම් සහ නාවික කර්මාන්තයේ යෙදී සිටින සමාගම් සමඟ සාකච්ඡා කර මෙම ගුවන් තොටුපල සහ වරාය ලෝකයේ අනෙක් ගුවන් සහ වරාය සමඟ සම්බන්ධ කරනු ලැබේ. මෙමගින් අපිට විශාල ආර්ථික වාසියක් සැලසෙනු ලැබේ. එමගින් සෘජු සහ වක්‍ර රැකියා ලක්ෂ ගණනින් ඇතිවනු ඇත. මෙය අප රටට මහත් සම්පතකි. අපිට ස්වාභාවිකව ලැබී තිබෙන කොළඹ සහ ත්‍රිකුණාමල වරායන් තවත් ප්‍රතිසංස්කරණය කරනු ලැබේ. ලෝකයේ කාර්යක්ෂමතාවයෙන් ඉහල අගයක් ගන්නා කොළඹ වරාය අපේ රටේ ආර්ථිකයට ලබාදෙනුයේ විශාල ශක්තියකි. තවද ත්‍රිකුණාමල වරායද ලෝකයේ නාවුක වෙළෙඳ කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීමට අප කටයුතු කරනු ලැබේ. අපිට ලැබී තිබෙන සම්පත් සියල්ල නිසි කළමණාකාරිත්වයක් යටතේ පාලනය කල යුතුයි. උපරිම වාසියක් ලැබෙන අයුරින් කළමණාකරණය කිරීමෙන් රටට විශාල ආර්ථික වාසියක් ලැබේ.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් ද රටේ ආර්ථිකයට දායක කර ගැනීම තවත් අරමුණකි. ජාත්‍යන්තර මට්ටමේ දක්ෂතා දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් වැඩි වශයෙන් එම ක්ෂේත්‍ර වලට යොමු කිරීම සහ ජාත්‍යන්තර තරඟ වලින් ජයග්‍රහණ අත්කරදෙන ක්‍රීඩකයින් දිරි ගැන්වීම කරනු ලැබේ. මෙමගින් ඔවුන්ට අනුග්‍රහය දැක්වීම ප්‍රමුඛ වේ.

රටක් ආර්ථික වශයෙන් දියුණුවීමට නම් නව තාක්ෂණික ක්‍රමවේද රටේ ආර්ථිකයට එකතු කරගත යුතුයි. මෙතෙක් කලක් අපේ රටේ සිදුවුයේ තාක්ෂණය එකතු කරනවා වෙනුවට විශාල කර්මාන්ත රාශියක් වසාදමා විදෙස් රටවලට පවරාදීමයි. අතීතයේ පැවති කර්මාන්ත පද්ධතිය නැවත පනගන්වා රටේ ආර්ථිකයට නැවත එකතු කරගත යුතුයි. අපේ රටේ පැවති පෙහෙකම්හල්, ටයර් නිෂ්පාදන ශාලා, ලුණු, සීනි, සිමෙන්ති ආදී නොයෙකුත් කර්මාන්ත නැවත සක්‍රීයව ආර්ථිකයට එකතු කරගත යුතුය.

තරුණ සංවිධානයක් වශයෙන් නවීන අදහස් තුලින් කර්මාන්ත දියුණු කිරීමට අප සතු දැනුම උපයෝගී කරගනු ලැබේ. වසාදමා තිබෙන කඩදාසි කම්හල් නැවත ආරම්භකර රටට අවශ්‍ය කඩදාසි රටතුලම නිපදවා ගනු ලැබේ. මේ නිසා විශාල මුදල් ප්‍රමාණයක් මෙරටින් පිටරටට යෑම වලකා ගත හැක.

දැනට ලෝකයේ ඉලෙක්ට්‍රොනික මෘදුකාංග නිෂ්පාදනය ඉතා ඉහළ අගයක් ගෙන ඇත. මෙයින් විශාල ආදායමක් උපදවා ගත හැක. දුරකථන ආශ්‍රිත ඉලෙක්ට්‍රොනික ක්‍රීඩා මෘදුකාංග මේ අතර විශේෂ ස්ථානයක් ගෙන ඇත. අප රටේ දක්ෂ මෘදුකාංග ඉංජිනේරුවරුන් පිරිසක් සිටී. මොවුන්ගේ දැනුම භාවිතා කර මෘදුකාංග නිෂ්පාදන ආයතන රැසක් පිහිටුවීමට කටයුතු කරනු ලැබේ. දේශීය මෙන්ම විදේශීය බොහෝ රටවලට අවශ්‍ය මෘදුකාංග නිෂ්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවෙනි. මෙය තවත් පුළුල් ව්‍යාපාරයක් බවට පත්කොට එමගින් විදේශ විනිමය රටතුලට ගලාගෙන එනු ලබන කර්මාන්තයක් බවට පත්කරනු ලැබේ.





ලොවක් දිනන්නට අධ්‍යාපනය

අප රටේ සාක්ෂරතාවය ඉතාමත් ඉහළ ස්ථානයක පැවතියත් ඉන් ඔබ්බට ගොස් දැයේ දරුවන්ට නිසි පහසුකම් සහිත පරිපූර්ණ අධ්‍යාපන රටාවක් නොලැබීම කණගාටුවට කරුණකි. රටේ පවතින බහුතර පාසල් සංඛ්‍යාවකට විධිමත් පහසුකම් නොමැත. අවශ්‍ය ගුරුවරු නොමැත. එනිසා දරුවන් පහසුකම් සහිත පාසල් වෙත යෑමට උත්සහ කරති. මෙයින් ග්‍රාමීය පාසල් වැසී යාමේ ප්‍රවනතාවයක් ඇත. එයින් සිදුවන්නේ දරිද්‍රතාවය වැඩි පවුල්වල දරුවන්ට ඉගෙන ගැනීමට ඇති අයිතීන් නැතිවී යාමයි. ස්වාධීන තරුණ බලවේගය මෙය හොඳින් වටහාගෙන රටේ පුරවැසියන්ගේද අදහස් හොඳින් විමසා බලා මෙම අධ්‍යාපන ප්‍රතිපත්ති මාලාව දැයේ දරුවන් වෙනුවෙන් නිර්මාණය කරන ලදී. මෙහිදී පවතින අධ්‍යාපන රටාවට නව මුහුණුවරක් එකතු කරමු. අපගේ ක්‍රමවේදය යටතේ රටේ මුළු අයවැයෙන් අධ්‍යාපනය වෙනුවෙන් 11%ක් වෙන් කරන්නට තීරණය කර ඇත.

මෙය ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති කිසිදු රජයක් ගෙන නැති ක්‍රියාමාර්ගයකි. මෙමගින් දරුවන්ට ඉගෙනීමට ඇතිවන සියළුම කරදර බාධා ඉවත් කිරීමට හැකිවේ. නිදහස් නිරවුල් මනසින් සියළුම දරුවන්ට අධ්‍යාපනය ලැබීමට අවස්ථාව හිමිකරදීම අපගේ වගකීමකි. සියළුම දරුවන් අධ්‍යාපනයෙන් පොහොසත්වීම රටක සංවර්ධනයේ වේගය වැඩි කිරීමට හේතුවකි. දැනුමින් සන්නද්ධ ශ්‍රම බලකායක් රටට අලුතින් එකතු වනු ඇත.

“

පෙර පාසල් අධ්‍යාපනයට නව දැක්මක්!

පෙර පාසල් අධ්‍යාපනය නගා සිටුවීම.

- සියලුම දරුවන් පෙර පාසල් යෑම අනිවාර්ය වේ.. (වයස - අවුරුදු 3 සිට අවුරුදු 7 දක්වා)

- පෙර පාසල් සඳහා විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයක් හා නව විෂයන් හඳුන්වා දීම.

- පෙර පාසල් ගුරුවරුන් සඳහා HND පාඨමාලාව හෝ උපාධිය අනිවාර්‍ය කරනු ලබන අතර එමගින් පෙර පාසල් දරුවන්ගේ මූලික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිකිරීමට අදහස් කෙරේ.

- සියළුම පෙර පාසල් එක් එක් ප්‍රදේශයට අයත් පාසලට අනුබද්ධිතව ක්‍රියාත්මක කරනු ලැබේ. සෑම පාසලකටම පෙර පාසල් සඳහා අවශ්‍ය ශාලා පහසුකම් ලබාදෙනු ලැබේ.

- පෙර පාසල් අධ්‍යාපනය සියලුම දරුවන්ට නොමිලේ ලබාදීමට කටයුතු කරනු ලැබේ. එමගින් රටේ සියළුම දරුවන්ට මූලික අධ්‍යාපනය හිමිවේ.

- පෙර පාසල් ගුරුවරු සඳහා රජයෙන් වැටුප් ක්‍රමවේදයක් හඳුන්වාදෙනු ලැබේ.

ප්‍රාථමික අධ්‍යාපනය

- පාසල් ළමුන් සඳහා අවම වයස් මට්ටම තීරණය කරනු ලැබේ. එහි දැනට පවතින ආකාරයට වයස අවුරුදු 6, අවුරුදු 7 දක්වා දීර්ඝ කරණු ලබන අතර එමගින්ද පාසල් යාම ආරම්භ කරන දරුවාට යම් අවබෝධයක් සමාජය කෙරෙහි ඇතිවේ.

- පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් වන දරුවාගේ වයස අවුරුදු 7 ක් විය යුතුය.

- ප්‍රාථමික අධ්‍යාපන කාල සීමාව නවවන ශ්‍රේණියේදී අවසන් වන අතර එම කාලය අවසානයේදී සාමාන්‍ය පෙළ විභාගය පැවැත්වීමට කටයුතු කෙරේ. එහිදී සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවාගේ වයස අවුරුදු 15 ක් වේ. පසුව ඉන් සමත්වන දරුවා ද්විතීයික අධ්‍යාපනය (උසස් පෙළ) සඳහා සුදුසුකම් ලබයි. අසමත් වන දරුවන්ට නැවත උත්සහ කළ හැකි අතර නැතිනම් කාර්මික විද්‍යාල වෙත යොමු වීම අනිවාර්ය වේ.

ද්විතීයික අධ්‍යාපනය

- ද්විතීයික අධ්‍යාපනය වසර එකකට පමණක් සීමා කරනු ලැබේ. එම කාල අවසානයේදී විශ්වවිද්‍යාල වරම් හිමිවනු ඇත. අසමත් වන සිසුන්ට නැවත තමන්ගේ අභිමතය පරිදි කැමති වාර ගණනක් උසස් පෙළ විභාගයට පෙනී සිටිය හැකි අතර ඉන් සමත් වීමෙන් විශ්වවිද්‍යාල වරම් හිමිවනු ඇත. මෙමගින් රටේ උපාධිදාරීන්ගේ සංඛ්‍යාව වැඩි වීමක් අපේක්ෂා කරනු ලැබේ. එය රටක සංවර්ධනයේ මිනුම් දණ්ඩ අගය ඉහල යෑමකි.

- උසස් පෙළ අසමත් වන සිසුන් සඳහා තමන්ට කැමති නම් කාර්මික විද්‍යාල පාඨමාලා තෝරා ගත හැක. මෙහි අරමුණ වන්නේ සෑම දරුවෙක්ම පාසල් අධ්‍යාපනය ලබා අවසන් කරන විට යම් වෘත්තීය සුදුසුකමක් හෝ උපාධියක් ලබා ගෙන සමාජයට එකතු කිරීමයි.

- කාර්මික විද්‍යාලය සහ පාසල ඒකාබද්ධ කොට නව අධ්‍යාපන සැලසුම් ක්‍රියාත්මක කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. එවිට සමාජයේ සිටින සියළුම දරුවන්, තරුණ තරුණියන් යම් වෘත්තීයක නියැලීමෙන් තමන්ගෙන් රටට ඉටුවිය යුතු යුතුකම් ඉටුකරනු ඇත.

තෘතීයික අධ්‍යාපනය

- විශ්වවිද්‍යාල වරම් ලබාගත් සිසුන් සඳහා පවතින ගැටලු ඉක්මනින් නිරාකරණය කරදීම.

- විශ්වවිද්‍යාල යටිතල පහසුකම් වැඩි කිරීම සහ නේවාසිකාගාර පහසුකම් වැඩි කිරීම.

- විශ්වවිද්‍යාල සිසුන් හදාරන විෂයන් පවතින රැකියා වෙළඳපොල අනුව නවීකරණය කිරීම.

- සෑම පළාතකටම එක් විශ්ව විද්‍යාලයක් පිහිටුවීම. ඉන් අදහස් කරන්නේ දැනට විශ්ව විද්‍යාල නොමැති පළාත්වලට පමණක් අලුතින් විශ්වවිද්‍යාල ඇති කිරීම. එමගින් උසස් පෙළ සමත්වන සියළුම දරුවන්ට විශ්වවිද්‍යාල වරම් හිමිවේ.

- විශ්වවිද්‍යාල කාල සීමාව අවසන් කරන විටම රැකියා සඳහා යොමු කිරීම. එමගින් රාජ්‍ය යාන්ත්‍රණය නැවත ශක්තිමත් වනු ඇත. රාජ්‍ය අංශයේ පවතින පුරප්පාඩු පෙර දැනුම් දී ඒ සඳහා සුදුසුකම්ලත් වෘත්තිකයන් කඩිනමින් බඳවා ගැනේ.

වෙනත්

- ගුරුවරුන්ගේ වැටුප් ප්‍රශ්නයට කඩිනමින් විසඳුම් ලබා දීම.
- නවක ගුරුවරුන් පාසල් වෙත යොමු කිරීම, සියළුම පාසල් ගුරු හිඟයකින් තොරව පවත්වා ගැනීම.
- දුෂ්කර පාසල් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදීම.
- සෑම පාසලකටම යටිතල පහසුකම් ලබාදීම, පානීය ජලය, වැසිකිලි පහසුකම් ලබාදීම.
- ළමුන් සඳහා පවත්වනු ලබන ශිෂ්‍යත්ව විභාගය අනිවාර්‍ය නොකිරීම.
- පාසල් සඳහා දන්ත වෛද්‍ය ඒකකයක් පිහිටුවීම. මෙහිදී ළමුන් 500 ට අඩු පාසල් 03 ක් සඳහා එක් දන්ත වෛද්‍ය මධ්‍යස්ථානය බැගින්ද ළමුන් 500 ට වැඩි පාසල් සඳහා එක් දන්ත වෛද්‍ය මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවනු ලැබේ. මෙමගින් පාසල් ළමුන්ගේ මුඛ සෞඛ්‍ය ගැටලු රාශියක් නිරාකරණය කිරීමට හැකි වේ.
- පාසල් ළමුන් සඳහා සෑම වර්ෂකට වරක් වෛද්‍ය පරීක්ෂණයක් සිදුකිරීම. නිරෝගී දරු පරපුරක් යනු රටට සම්පතකි. දරුවන්ට ඇති ශාරීරික හා මානසික ගැටලු හඳුනාගෙන ඒවාට කල්තියා පිළියම් යෙදීම මෙහි අරමුණයි.
- අන්තර්ජාල පහසුකම් පාසල් සඳහා ලබාදීම.
- සෑම පාසලකටම පුස්තකාලයක් ලබාදීම.
- පාසල් උපකරණ හිඟයකින් තොරව සෑම පාසලක්ම පවත්වා ගැනීම.
- රටේ පවතින නීතිය පාසල් විෂයක් ලෙස ඉගැන්වීම. මේ සඳහා සෑම පාසලකටම එක් නීතිඥවරයෙක් අනියුක්ත කරනු ලැබේ. මෙමගින් සෑම දරුවෙක්ම පාසල් අධ්‍යාපනය හදාරා අවසන් කොට සමාජයට නීතිගරුක පුරවැසියෙක් ලෙස එකතු කිරීමට අපේක්ෂා කෙරේ. නීතිගරුක පුරවැසියන් සමාජයේත් රටේත් යහපැවැත්මට අත්‍යවශ්‍ය කරුණකි.
- දැනට පවතින ප්‍රාගෝගික තාක්ෂණික කුසලතා විෂයේ සිසුන් තුල ප්‍රායෝගික ජීවිතයේ වැදගත් වන ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා පාසල් වල පහසුකම් සුලබ කිරීම ඉතා වැදගත් වේ. මෙහිදී පෙදරේරු කර්මාන්තය, වඩු කර්මාන්තය, විද්‍යුත් උපකරණ පිළිබඳ දැනුම මෙන්ම පරිගණක සාක්ෂරතාවය ප්‍රායෝගිකව පුහුණුවිය හැකි ආකාරයට පාසල් පහසුකම් අතින් සන්නද්ධ කිරීමට පියවර ගැනේ.



ආරෝග්‍ය පරමා ලාභා

“නිරෝගීමත්භාවය උතුම්ම ලාභයයි” තේමාව කරගත් ස්වාධීන තරුණ බලවේගය මේ සඳහා විශේෂ අවධානයක් යොමුකොට ඇත. රට තුළ තවමත් සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි ක්‍රමවත්බවක් දකින්නට නොමැත. රෝගීන් සඳහා වෛද්‍යවරයෙකු හමුවීමට ඇති කාලය තවමත් නිසි අයුරින් අඩුවී නැත. එක් වෛද්‍යවරයෙකුට රෝගීන් විශාල සංඛ්‍යාවක් පරීක්ෂා කිරීමට සිදු වී ඇත.

එය සංවර්ධනය වීමට උත්සහ කරන රටකට සුදුසු නොවේ. මෙහිදී කලට වේලාවට නිසි ඖෂධ නොමැතිකම රෝග උත්සන්න වීමට බලපා ඇත. රෝගීන් සඳහා ඖෂධ අධික මිලට විකිණීම බහුලව සිදුවන ක්‍රියාවකි. මෙයින් දුප්පත් ජනතාව තදින්ම අසරණ වේ. හෘද රෝගීන් සඳහා ඔවුන්ගේ වාරය පැමිණෙන තෙක් බොහෝ කල් බලා සිටීමට සිදුවීම කණගාටුවට කරුණකි. අපට නිදහස ලැබී වසර 73 ක් ගතවී ඇතත් රටේ සෞඛ්‍ය නගා සිටුවීමට තවමත් නිසි රාජ්‍ය යාන්ත්‍රණයක් නොමැති වීම දුක්බර පුවතකි.

මෙය බොහෝ විට ඖෂධ මාෆියාව සහ පෞද්ගලික රෝහල් මාෆියාව නිසා සිදුවන කටයුත්තකි. මේ නිසා රෝගීන් රජයේ රෝහල්වලින් නිසි ප්‍රතිකාර නොලැබෙන විට පෞද්ගලික රෝහල් සහ පෞද්ගලික ඖෂධාගාර වෙත යැවෙන ක්‍රමවේදයක් නිර්මාණය වී ඇත. අවාසනාවට අපද එහි ගොදුරක් බවට පත්වී ඇත. මෙය වහාම නවතා දැමිය යුතුයි.

අප වාර්ෂික අයවැයෙන් 8% ක් සෞඛ්‍ය සඳහා වෙන්කරනු ලැබේ. මෙමගින් සාමාන්‍ය රෝගීන් මෙන්ම හෘදයාබාධ, වකුගඩු පිළිකා ආදී නොයෙකුත් දරුණු රෝගී තත්ත්වයන් හා වසංගත තත්ත්වයන් වෙනුවෙන් මුහුණ දිය හැකි ශක්තිමත් සෞඛ්‍ය පද්ධතියක් ස්ථාපිත කිරීමට අදහස් කෙරේ. රටක් තුළ සෞඛ්‍ය සේවාවෙහි ගුණාත්මකභාවය වැඩි කිරීම තුලින් ක්‍රමයෙන් නිරෝගිමත් ජනතාවක් රටට දායාද වේ. නමුත් අප රට තුළ දක්නට ලැබෙන්නේ දිනෙන් දින රෝගීන් සංඛ්‍යාව ඉහළ යන ක්‍රමයක්ය. මෙය රටෙහි සංවර්ධනයට අයහපත් ලෙස තදින්ම බලපානු ලබයි. රටක සෞඛ්‍ය සේවාවෙහි ගුණාත්මකභාවය වර්ධනය කරන විට රෝගීන් සංඛ්‍යාවෙහි පහල යෑමක් අපේක්ෂා කෙරේ. සෞඛ්‍ය සඳහා යොදවන මුදල් ප්‍රමාණය විශාල වුවත් හොඳ යහපත් සෞඛ්‍ය ක්‍රමවේද ජනතාවට හුරු පුරුදු නොකිරීම රටෙහි සෞඛ්‍ය පිරිහීමට හේතු වේ.

මේ නිසා අපට සෞඛ්‍ය යාන්ත්‍රණයට යොදවනු ලබන මුදලේ ප්‍රමාණය වැඩිකිරීම තුළින් පමණක් සෑහීමට පත්විය නොහැක. මේ නිසා හොඳ මහජන සෞඛ්‍යයක් පවත්වා ගැනීමට යාන්ත්‍රණයක් සැකසිය යුතුයි. දුම්පානය, මත්පැන් පානය, ආදී ක්‍රමවේදයන් තුළින් ජනතාව ඈත් කළ යුතුයි. තවද ගුණාත්මක පෝෂ්‍යදායී ආහාර රටාවකට ජනතාව හුරුකල යුතුයි. හොඳ සිරිත් විරිත් රැක ගැනීම තුළ අපගේ පැරැණ්නන් තමන්ගේ ශාරීරික සෞඛ්‍ය මනාව පවත්වාගෙන ඇත. අපද එම සෞඛ්‍ය පුරුදු මහජනයාට හුරු පුරුදු කල යුතුය.

- ඉතාමත් වටිනාකම් එකතු කරන ලද හෙල ඖෂධ යොදා කරනු ලබන වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම. මෙහිදී පාරම්පරික ඖෂධ වට්ටෝරු එකතු කර ඒවා ග්‍රන්ථාරූඪ කරනු ලැබේ.
- පාරම්පරික වෛද්‍යවරුන් සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීමට ක්‍රමයක් ඉදිරිපත් කරනු ඇත. ඔවුන්ගේ ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය ඖෂධ ශාක ලබා ගැනීමට ඇති බාධක ඉවත් කරනු ඇත.
- දැනට පවතින බටහිර වෛද්‍ය ක්‍රමයත් ආයුර්වේද වෛද්‍ය ක්‍රමයත් යන දෙකම එකම රෝහලක් තුළට ගෙනෙන ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ. මෙහිදී රෝගීන්ට වඩාත් පහසුවෙන් අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට හැකිවේ. සමහර රෝගීන් සඳහා පාරම්පරික ඖෂධ ද සමහර රෝගීන් සඳහා බටහිර ඖෂධ ද ලබා ගැනීමට ඔවුන් වෙන වෙනම රෝහල් වෙත යෑම මින් නවතිනු ඇත. රෝගීන්ට අවශ්‍ය සියළුම ආකාරයේ ඖෂධ එකම රෝහලකින් ලබාදීමට කටයුතු කිරීමට අදහස් කෙරේ.
- ආයුර්වේද වෛද්‍ය විද්‍යාවද බටහිර වෛද්‍ය ක්ෂේත්‍රය තරමටම ඉහලට ගෙනෙනු ලැබේ. මින් පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රමය රැක ගනිමින් රටතුල හොඳ සෞඛ්‍ය සේවාවක් ලබා දීමට හැකිවේ.
- සියලුම රෝහල් සඳහා හදිසි ප්‍රතිකාර ඒකකයක් ලබාදීම.
- සෑම රෝහලකටම හිගයකින් තොරව ඖෂධ ලබාදීම.
- රෝහල් සඳහා යටිතල පහසුකම් වැඩි කිරීම.
- සෑම රෝහලකටම ගිලන් රථ පහසුකම් ලබාදීම. අවම වශයෙන් එක් රෝහලකට ගිලන් රථ 4 ක් ලබාදීම.
- රෝගීන් සඳහා හදිසි ඇමතුම් දුරකථන සේවා මධ්‍යස්ථානයක් පිහිටුවීම. එහිදී රෝගියා නිවසේ සිටියදීම රෝහලට නොගොස් ප්‍රතිකාර ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ. මෙහිදී වෛද්‍යවරයෙකු නිවසට යවා රෝගියාගේ තත්ත්වය පරීක්ෂා කිරීම සිදුකරනු ඇත. අවශ්‍ය වුවොත් රෝගියා රෝහලට ගෙනයාමට ගිලන් රථය නිවසට එවනු ලැබේ.
- සෑම පුරවැසියෙකුටම සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබාදීම සිදුකරනු ඇත. මෙහිදී සෞඛ්‍ය සහ රක්ෂණය එකට බැඳුණු ක්‍රමවේදයක් තුළින් රෝගීන්ට වඩාත් කාර්යක්ෂම සෞඛ්‍ය සේවාවක් ලබාදීම අරමුණ කෙරේ. සෑම පුරවැසියෙකුටම රක්ෂණයක් හිමිවීම තුළින් හදිසි රෝගාබාධ සඳහා තමන්ගේ වියදමින් රෝහල් ගතවීමට අවශ්‍ය නොවේ. ඕනෑම වේලාවකදී තමන්ට කැමති රෝහලක නැවතී ප්‍රතිකාර ලබා ගැනීමට රෝගියාට හැකියාව ලැබේ. මේ නිසා ප්‍රතිකාර සඳහා යන වියදම් සියල්ල රක්ෂණ සමාගම මගින් ගෙවනු ලැබේ. මෙය අප රට තුල සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ලොකු පිබිදීමකට පාදක වනු ඇත. දේශීය මෙන්ම විදේශීය රෝහලක ප්‍රතිකාර ලබා ගන්නා විට ඒ සඳහා යන සියලුම වියදම් රක්ෂණ සමාගම මගින් ගෙවනු ලැබේ. යම් හෙයකින් රෝගියා රෝහලේ දී මිය ගියහොත් වන්දි මුදලක් රක්ෂණ සමාගම මගින් ගෙවනු ලැබේ. සෑම වර්ෂයකට වරක් සියළුම පුරවැසියන් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කරනු ලැබේ. රටේ මහජනතාවට ඇතිවන රෝගාබාධ කල්තියා හඳුනාගෙන අවශ්‍ය ප්‍රතිකාර කිරීමට මින් හැකියාව ලැබේ.
- මදුරුවන් වැනි සතුන් මගින් බෝවන රෝග සහමුලින්ම නවතා දැමීමට කටයුතු කෙරේ. ඩෙංගු වැනි මදුරුවන් මගින් බෝවන රෝග නිසා මහජනතාව විශාල අසීරුතාවයන්ට ලක්වී ඇත. තවද බරවා වැනි රෝගද රටේ උත්සන්න වී ඇත. මේ නිසා වැඩිහිටියන් සහ ළමුන් විශාල ප්‍රමාණයක් වාර්ෂිකව මියයයි. මෙම උවදුර සහමුලින්ම රටින් තුරන් කරනු ලැබේ.

- සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලකට ජනතාව හුරු කිරීම. අහිතකර රසායනික වර්ණක යොදා කරනු ලබන ආහාර නිෂ්පාදන සියල්ල තහනම් කෙරේ. සියලුම ආපනශාලා සේවකයින්, හිමිකරුවන් තමන්ගේ ආපනශාලාවල් පවත්වාගෙන යෑම සඳහා විධිමත් සෞඛ්‍ය ක්‍රමවේද භාවිතා කල යුතුයි. එහිදී ආපනශාල තුල පිරිසිදු බව, සේවකයින්ගේ වෛද්‍ය සහතික, අලෙවිකරනු ලබන ආහාරවල ගුණාත්මකභාවය මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් මගින් සොයා බලනු ලැබේ. ආපනශාල පවත්වාගෙන යෑමට සෞඛ්‍ය බලපත්‍රයක් ලබාගත යුතුයි.
- පිරිසිදු ගුණාත්මක ආහාර වේලක් ලබාගැනීමට සියලුම පුරවැසියන්ට අයිතියක් ඇත. ශරීරය තුලින් මතුවන ලෙඩරෝග හටගන්නේ අප ගනු ලබන ආහාරවල ගුණාත්මකභාවයෙහි ඇති අඩුපාඩු තුලිනි. මහාමාර්ග ආසන්නයේ දුවිලි, විෂබීජ බහුලව ඇති පරිසර තුල විවෘත ආහාර අලෙවිය තහනම් කෙරේ. ඒ සඳහා ක්‍රමවත්ව ආවරණය කරන ලද කුටියක් තුල ආහාර වර්ග අලෙවිකල යුතුය.
- ග්‍රාමීය රෝහල් වෛද්‍යවරුන්ගේ හිඟයක් නොමැතිව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පියවර ගැනීම. ඒ සඳහා නවක වෛද්‍ය පත්වීම් කඩිනමින් එම රෝහල් වෙත අනියුක්ත කරනු ලැබේ. මෙමගින් රෝගීන් අසරණ වීම නවතාලීම අරමුණු කරනු ලැබේ. තවද විශේෂඥ වෛද්‍යවරුන් සෑම රෝහලකටම අනියුක්ත කෙරේ.
- රිය අනතුරු නිසා සිදුවන මරණ සංඛ්‍යාව දිනෙන් දිනම ඉහළ යෑමක් පවතී. මෙය බොහෝවිට සිදුවන්නේ අනතුරට පත් පුද්ගලයා රෝහල වෙත ගෙන ඒමට කටයුතු කිරීමේදී සිදුවන ප්‍රමාදය නිසයි. අනතුරට පත් පුද්ගලයකු ඉක්මනින්ම රෝහල වෙත ගෙනයාමට හදිසි අනතුරු ගිලන් රථ සේවාවක් සෑම රෝහලක්ම අනුබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ. මේ සඳහා අනතුරක් සිදුවී ඇතැයි දුටු සැනින් එක් දුරකථන ඇමතුමක් මගින් දැනුම් දීම ප්‍රමාණවත්ය. අනතුර සිදුවී විනාඩි කිහිපයක් තුළ වෛද්‍ය පහසුකම් සහිතව ගිලන්රථය එම ස්ථානයට පැමිණෙනු ඇත. එම කණ්ඩායමට කාර්මික නිලධාරීන් දෙදෙනෙකු ඇතුලත් කෙරේ.
- වඩාත් සුහදශීලී සෞඛ්‍ය ක්‍රමවේදයක් හඳුන්වාදීම. යම් රෝගියෙකු රෝහල වෙත පැමිණිවිට ආරම්භයේ සිට අවසානය දක්වා වඩාත් ක්‍රියාශීලී සහ සුහදශීලීව කටයුතු කෙරෙන ක්‍රමයක් තුලින් ජනතාවට පහසුව ඇතිවේ. දැනට රටේ පවතින ක්‍රමය අනුව රෝගීන් විශාල ලෙස රෝහල් තුල කාලය නාස්ති කරනු ලැබේ. රෝගියාට රෝහල තුළ නිසි මගපෙන්වීමක් නොමැතිකම එයට හේතුවයි. රෝහල් පරිශ්‍රයට පැමිණි රෝගියාට ඉතාමත් අඩු කාලයකින් තමන්ට අවශ්‍ය පහසුකම් සැපයිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය කරන මානව සම්පත් තවත් පුළුල්ව රෝහල් වෙත සපයනු ලැබේ.
- වෛද්‍යවරයෙකු විසින් අධ්‍යයනය කලයුතු රෝගීන් සංඛ්‍යාවෙහි ප්‍රමාණය අඩුකරනු ලැබේ. දැනට අපගේ රෝහල් තුල විශාල දිගු පෝලිම් දක්නට ඇත. මෙය රෝගීන්ගේ කාලය අපතේ යෑමකි. මේ නිසාම එක් වෛද්‍යවරයෙකු අධ්‍යයනය කල යුතු රෝගීන් සංඛ්‍යාව 10 දක්වා අඩුකරන ක්‍රමයක් හඳුන්වාදෙනු ඇත. මේ සඳහා රෝහල් වෙත වෛද්‍යවරුන් වැඩිපුර අනියුක්ත කරනු ලැබේ.
- සියලුම රෝහල් (රාජ්‍ය, පෞද්ගලික) ජාලගත කරනු ලැබේ. එනම් සියලුම පුරවැසියන්ගේ තොරතුරු ඇතුලත් ඩිජිටල් සිටි (Digital city) ක්‍රමය හඳුන්වා දීම තුලින් යම් පුද්ගලයකු රෝහල් පරිශ්‍රයට පැමිණ සේවා ලබාගැනීමේදී ඔහුගේ පෙර රෝගී දත්ත කියවීමේ හැකියාව වෛද්‍යවරයාට ලැබේ. මෙය අත්‍යාවශ්‍ය කරුණකි. එය රෝගියා පිළිබඳව අධ්‍යනය කර ප්‍රතිකාර කිරීම වඩාත් පහසු කරයි.





නීතියේ සමානාත්මතාවය

නීතියේ ආධිපත්‍ය සුරැකීම සියළුම පුරවැසියන් නීතිය හමුවේ එක හා සමානව සැලකීම. ජාති, ආගම්, කුල, නිලතල අනුව විභේදනයකින් තොරව වරදට දඬුවම් දෙන නීතිමය ක්‍රමවේදයක් ස්ථාපිත කරනු ලැබේ. අධිකරණය ස්වාධීන ආයතනයක් බවට පත් කිරීම මෙහිදී මූලික කටයුත්තක් වශයෙන් සිදුකෙරේ.

අපේ රට විවිධ ජාතීන් ජීවත් වන රටකි. එම නිසා සමාජයේ පුරවැසියන් එකසේ සාමයෙන් හා සහයෝගයෙන් ජීවත් විය යුතුයි. ස්වාධීන තරුණ බලවේගය විසින් සමාජයේ එකිනෙකාට සතර සංග්‍රහ වස්තුවෙන් සංග්‍රහ කරන සාමය රජයන සමාජයක් නිර්මාණය කරනු ලැබේ. ජාතික සමගිය ආරක්ෂා කිරීම අප කාගේත් වගකීමකි. ඒ නිසා ජාතීන් අතර සුහදත්වය වර්ධනය කරන වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලැබේ.

සංශෝදනය කරනු ලබන නීති

- සුළු වැරදිකරුවන්ට නිදහස ලබා දීම.
- පීවිතාන්තය දක්වා පනවනු ලබන සිර දඬුවම අහෝසි කිරීම. ඒ වෙනුවට මරණ දණ්ඩනය ක්‍රියාත්මක කිරීම. නියම කරනු ලැබූ දින සිට දින 7 ක් අවසානයේ මරණ දණ්ඩනය ක්‍රියාත්මක කරනු ලැබේ.
- ස්ත්‍රී දූෂණයක් සිදුකලා යැයි උසාවියෙන් වරදකරු වුවහොත් ලිංග ඡේදනය කරනු ලැබේ. ස්ත්‍රීයන්ගේ ආත්ම ගරුත්වය ඇයට ඇයගේ පීවිතයටත් වඩා වටිනා දෙයකි. මේ නිසා මෙවැනි වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබාදිය යුතුය.
- ළමා අපචාර, ළමයින් දූෂණය කිරීමෙන් යම් පුද්ගලයකු වැරදිකරු යැයි සනාථ වුවහොත් ඔහුට හෝ ඇයට මරණ දණ්ඩනය ක්‍රියාත්මක කරනු ලැබේ.

- අල්ලස් හෝ දූෂණ සඳහා දඬුවම්. යම් පුද්ගලයෙකු අල්ලස් හෝ දූෂණ වංචා සඳහා යොමුවී එය ක්‍රියාත්මක කර නීතියේ රැහැනට හසුවූ විට ඔහුට හෝ ඇයට කර ඇති වංචාවේ බරපතලකම අනුව දඬුවම් තීරණය කෙරේ. බ්‍රහ්ම දණ්ඩනය පැනවීම අනිවාර්ය කෙරේ. ඔහුගේ හෝ ඇයගේ පවුලේ ඥාතීන්ට ද බ්‍රහ්ම දණ්ඩනය පැනවේ.

- මහජන මුදල් හෝ දේපල සොරකම් කිරීම. මේ සඳහා මංකොල්ලකන ලද මුදල් නැවත ලබාගන්නා අතර සොරකම් කරන ලද මුදලට පොලිය ද අයකෙරේ. ඊට අමතරව මහජන මුදල් මංකොල්ලකෑම නිසා සිදුවූ හානිය ගණනය කල නොහැකි අතර දඬුවම් ලෙස මරණ දණ්ඩනය ක්‍රියාත්මක කෙරේ.

- තවද සුළු සොරකම් සඳහා අතෙහි වැලමිටෙන් පහළ කොටස කපා ඉවත් කරනු ලැබේ.





ප්‍රමාද නොවන ප්‍රවාහනය

අප රට තුල සැමට සුවසේ ගමන් කල හැකි ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ. රට තුල පවතින රාජ්‍ය සහ පෞද්ගලික ප්‍රවාහන සේවයේ ගුණාත්මක බව ඉහල නැංවීමට ගතයුතු සියලුම ක්‍රියාමාර්ග ගනු ලැබේ. ප්‍රවාහනය කිසිසේත්ම පෞද්ගලීකරණය කරන්නේ නැත. මහජනතාවට සුවපහසුව සහිත පොදු ප්‍රවාහන සේවාවක් ලබාදීම අපගේ අරමුණයි. කොතරම් කලක් ගතවුවත් රටතුල තවමත් ජනතාවට සුවසේ බස් රථයකට ගොඩවී ගමන් කිරීමේ පහසුවක් නොමැත. විශේෂයෙන්ම කාර්ය බහුල වේලාවන් වලදී ජනතාව මහත් අසීරුතාවන්ට පත්වේ. බස්රථ තුල තෙරපීමෙන් විවිධ වදහිංසා වලට ලක්වෙමින් ගමන් කිරීමට සිදුවී ඇත. තවද බස් රථ තුළ කාන්තාවන්ට විවිධ අතවර සඳහාද මුහුණ පාන්නට සිදුවී ඇත. මේ නිසා මහජනතාවට සිදුවන අසීරුතාවයන් සියල්ලටම පිළිතුරු සැපයීම අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුල අන්තර්ගත කර ඇත.

- බස්රථ තුල අසුන් ගණනට පමණක් මගීන් නංවා ගත හැක. බස්රථ තුල අසුන් ගණනට වඩා මගීන් රැගෙන යාම තහනම්.
- බස් රථයට ගොඩවන සෑම මගියෙකුටම අසුනක් ලබා දීම රියදුරු මහතාගේ සහ කොන්දොස්තර මහතාගේ වගකීම වේ. එසේ නොකරන බස්රථ සඳහා බලපත්‍රය අවලංගු කරනු ලැබේ.
- බස් රථය තුල හිටගෙන යෑම තහනම්.
- වේගය ඉක්මවා බස්රථ ධාවනය තහනම්.
- මගීන් ප්‍රවාහනය සඳහා වායුසම්කරණය කරන ලද බස්රථ ධාවනය පුළුල් කිරීම.
- ගමන් ආරම්භයේ සිට ගමනාන්තය දක්වා මගියාගේ ගමන් මාර්ගය පිළිබඳ දත්ත සටහන් ක්‍රමවේදයක් හඳුන්වා දීම. මෙමගින් මගීන්ට වඩාත් ආරක්ෂාවක් සැලසීම අරමුණුවේ.
- නගරය තුළ ගමනාගමනය සඳහා විශේෂිත වූ ප්‍රවාහන සේවා ක්‍රමයක් සැපයීම. ඒ සඳහා විදුලියෙන් ක්‍රියාත්මක වන බස්රථ හඳුන්වා දීම. මෙමගින් පරිසරය දූෂණය වීම අවම කරගැනීමට හැකිවේ.



- දුම්රිය සේවා කටයුතු පුළුල් කිරීම. සීඝ්‍රඝාමී දුම්රිය සේවා තව තවත් පුළුල්ව භාවිතයට යොමු කිරීම.
- දුම්රිය සහ බස්රථ සඳහා මගී ටිකට්පත් වෙනුවට පෙරගෙවුම් කාඩ්පතක් ලබා දීම.
- ආබාධිත ප්‍රජාව සඳහා පහසුකම් සහිත ප්‍රවාහන සේවාවක් හඳුන්වාදීම.

අනෙකුත් ප්‍රවාහන සේවා,

වළවළු, පළතුරු, ප්‍රවාහනයට පෙර නිසිලෙස ඇසුරුම් කිරීම අනිවාර්ය කිරීම. එමඟින් ප්‍රවාහනයේදී සිදුවන තැලීම, පොඩිවීම ආදියෙන් වළවළුපළතුරු වර්ග විශාල ප්‍රමාණයක් අපතේ යෑම වලක්වා ගැනීමට හැකිවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන



- රට තුල දීර්ඝකාලීන සංවර්ධන සැලැස්මකට සරිලන ජාතික ප්‍රතිපත්තියක් හඳුන්වාදීම.
- විධායක ජනාධිපති ක්‍රමය තුලම සිටිමින් ජනාධිපතිතුමාගේ කටයුතු අධ්‍යනය කල හැකි විධායක කමිටුවක් / නායකත්ව මණ්ඩලයක් පත් කිරීම. එමගින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව ජනාධිපති ඇතුලු අමාත්‍ය මණ්ඩලය හැසිරවීම සහ ඔවුන්ගේ වැඩ කටයුතු අධීක්ෂණය කිරීම. ජාතික ප්‍රතිපත්තියට පරිබාහිරව කටයුතු කරන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය විධායක කමිටුවට/ නායකත්ව මණ්ඩලයට ඇත.
- ජනාධිපතිතුමාට ඇති නීතියේ මුක්තිය ඉවත්කර නීතිය බලවත් කිරීම. නීතිය සැමටම එක හා සමානව ක්‍රියාත්මක කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීන් සංඛ්‍යාව 50යි. එමගින් දැනට සිටින 225, 50 දක්වා අඩු කෙරේ.
- දිස්ත්‍රික්ක 23 යි, මන්ත්‍රීන් 23 ක් සහ විපක්ෂ මන්ත්‍රීන් 23 ක් වේ. මෙහිදී ඇමති මණ්ඩලය, ආණ්ඩු පක්ෂ මන්ත්‍රීන් 23 දෙනාගෙන් සමන්විත වන අතර නියෝජිත ඇමති මණ්ඩලය විපක්ෂ මන්ත්‍රීන් 23 දෙනාගෙන් සමන්විත වේ.
- ඇමතිවරුන්, මන්ත්‍රීවරුන් සඳහා ලබාදෙනු ලබන සියලුම දීමනා කපාහරිනු ලැබේ. වැටුප පමණක් ලබා දේ.
- වසර 5 ක් අවසානයේදී දෙනු ලබන විශ්‍රාම වැටුප අහෝසි වන අතර, එය වසර 10 ක් අවසානයේදී පමණක් ලබාදේ. එනම් නැවත වරක් ඡන්දයකින් පත්වුවහොත් පමණක් දෙවන අවස්ථාවේදී වසර 5 අවසානයේ ගෙවනු ලැබේ.
- පළාත් 9 සඳහා මහ ඇමතිවරුන් 9 දෙනෙක් සහ විපක්ෂව ඇමතිවරුන් 9 දෙනෙකුගෙන් පමණක් සමන්විත වේ. මේ එක් පළාතක් සඳහා ආණ්ඩු පක්ෂයේත් ඇමතිවරයාද, විපක්ෂයේත් එක් මන්ත්‍රීවරුයෙකු පමණක් වේ.
- ප්‍රාදේශීයසභා සඳහා එක් ප්‍රාදේශීය සභාවකට ආණ්ඩු පක්ෂයෙන් එක් මන්ත්‍රීවරයෙක් සහ විපක්ෂයෙන් එක් මන්ත්‍රීවරයෙක් පමණක් නියෝජනය වේ.
- නගරසභා සඳහා එක් එක් නගර සභා සඳහා ද ආණ්ඩු පක්ෂයෙන් එක් මන්ත්‍රීවරයෙක් සහ විපක්ෂයෙන් එක් මන්ත්‍රීවරයෙක් පමණක් නියෝජනය වේ.

ඇත් රට ඇත් දෑතින්
ගොඩනගමු



ස්වාධීන තරුණ බලවේගය

சுதந்திர இளைஞர் சக்தி

INDEPENDENT YOUTH POWER